00115

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන 2017/2018

අවසාන පරීක්ෂණය

**EPC1533/ESC1233 -ළමා මනෝවිද්‍යාව**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2019.04.23 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. "මානව සංවර්ධනයේ එක් වැදගත් අංගයක් ලෙස කායික සංවර්ධනය හඳුනාගත හැකි ය."

 "කායික සංවර්ධනය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

02. පෙරපාසල් ගුරුවරියකට "ළමා මනෝවිද්‍යාව" ඉගෙනීමෙන් වන ප්‍රයෝජන පහක් (05) ලියන්න.

03. "පූර්ව ප්‍රසව සංවර්ධන"ය අවධි තුනකට (03) වෙන්කර කතා කරනු ලැබේ. එම අවධි තුන (03) නම් කරන්න.

04. "ළමයින් අධ්‍යයනය කිරීමේදී ජීවලේඛන වාර්තා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ." **"ජීවලේඛන වාර්තා"** යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

05. **"ආත්ම කේන්ද්‍රීයභාවය"** යනු කුමක්දැයි උදාහරණයක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. නවජ සූතියෙකුගේ (අලුත උපන් බිළිඳෙකුගේ) හැකියාවන් පහක් (05) ලියා දක්වන්න.

07. **"මනෝචාලක"** හැකියා යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

08. සංජානනය සිදුවන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

( ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ළමයෙකුගේ "පූර්ණ පෞරුෂ සංවර්ධනය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "නිරීක්ෂණය ඉතා වැදගත් ළමා අධ්‍යයන ශිල්පීය ක්‍රමයක් වේ." ඔබ මෙයට එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

10. (i) "අවප්‍රමාණ චර්යා" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ළමයින් තුළින් දක්නට ලැබෙන "අවප්‍රමාණ චර්යා" තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 06)

(iii) ළමයින් තුළ අවප්‍රමාණ චර්යා ඇතිවීමට හේතුවන සාධක තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 06)

(iv) ඔබ සඳහන් කළ එක් සාධකයක් අවප්‍රමාණ චර්යා ඇතිවීමට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

11. (i) පූර්ව ප්‍රසව සංවර්ධනය කෙරෙහි බලපාන පරිසරාත්මක සාධක තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ සඳහන් කරන ලද ඕනෑම එක් සාධකයක අයහපත් බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අලුත උපන් බිළිඳෙකුගේ මූලික ශාරීරික අවශ්‍යතා හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(iv) බිළිඳුවියේ දී සිදුවන බුද්ධි සංවර්ධනය පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) පියාජේට අනුව ප්‍රජානන සංවර්ධනයේ අවධි හතර **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) සදාචාර සංවර්ධනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ළමයෙකුගේ සදාචාර සංවර්ධනය පිළිබඳව පියාජේගේ හා ෆ්‍රොයිඩ්ගේ මත සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) පෙර පාසල් අවධියේ ළමයින් තුළ දක්නට ලැබෙන පොදු චිත්තවේගීය රටා හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) එම චිත්තවේගීය රටා දෙකක් **(02)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) පෙර පාසල් අවධියේ ළමයින් තුළ යහපත් චිත්තවේග සංවර්ධනය කිරීමට පෙර පාසල් ගුරුවරියකට මැදිහත් විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.